# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1449 /2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 | දිනය<br>திகதி<br>Date | 19/11/2023<br>පැය 1205 |

# මාධ්‍ය නිවේදනය

**01. 2023.11.18 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 08 | 08 | 387 | 1280 | තඹ දඟර 06<br>ගෑස් ලිප් 01<br>ගෑස් සිලින්ඩර් 01<br>යකඩ බැරල් 12<br>යතුරුපැදි 01 |

වැටලීම සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් සහ දේපල පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02. හෙරොයින් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසය.**

2023.11.18 වන දින දහවල් කාලයේ බ්ලූමැන්ඩල් පොලිස් වසමේදී පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත **හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලි ග්‍රෑම් 920 ක් සහ හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලි ග්‍රෑම් 820 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට** ගෙන බ්ලූමැන්ඩල් පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 23 ක් හා 40 ක් වන බ්ලූමැන්ඩල් සහ, කොළඹ 13 ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ. බ්ලූමැන්ඩල් පොලිසිය මගින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් හා කඩුවක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුෂ්පාරාම උප කඳවුර.**

2023.11.18 වන දින සවස් කාලයේ දී පොලිස් විශේෂ කාර්ය බලකා පුෂ්පාරාම උප කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත යක්කලමුල්ල පොලිස් වසමේ ඇල්ල ඉහළ ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සහ කඩුවක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන යක්කලමුල්ල පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 ක් වූ දොල ඇල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. යක්කලමුල්ල පොලිසිය මගින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04.** **කේරළ ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පස්සර කඳවුර.**

2023.11.18 වන දින සවස් කාලයේ දී පොලිස් විශේෂ කාර්ය බලකා පස්සර කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත බදුල්ල පොලිස් වසමේ කටුපැලැල්ලගම ප්‍රදේශයේ දී වැටලීමක් සිදුකර **කේරළ ගංජා ග්‍රෑම් 217 මිලිග්‍රෑම් 870 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන බදුල්ල පොලිසිය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වන කටුපැලැල්ලගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. බදුල්ල පොලිසිය මගින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05.** **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා තිරුක්කෝවිල් කඳවුර.**

2023.11.18 වන දින සවස් කාලයේ දී පොලිස් විශේෂ කාර්ය බලකා තිරුක්කෝවිල් කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත තිරුක්කෝවිල් පොලිස් වසමේ තංගවේලායුධපුරම් ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන තිරුක්කෝවිල් පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 20 ක් වූ විනයාගපුරම් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. තිරුක්කෝවිල් පොලිසිය මගින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06.** **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පරයනාලන්කුලම් කඳවුර.**

2023.11.18 වන දින සවස් කාලයේ දී පොලිස් විශේෂ කාර්ය බලකා පරයනාලන්කුලම් කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත මඩු පොලිස් වසමේ පුංචිකුලම් ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන මඩු පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 43 ක් වූ පෙරියපුංචිකුලම් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. මඩු පොලිසිය මගින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07.** **බලපත්‍ර නොමැතිව ට්‍රැක්ටර් රථයකින් වැලි ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා නෙල්ලිඅඩි කඳවුර.**

2023.11.18 වන දින උදෑසන කාලයේ දී පොලිස් විශේෂ කාර්ය බලකා නෙල්ලිඅඩි කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත කොඩිකාමම් පොලිස් වසමේ වරණි උතුර ප්‍රදේශයේ දී වැටලීමක් සිදුකර **බලපත්‍ර නොමැතිව ට්‍රැක්ටර් රථයකින් වැලි කියුබ් ¾ ක් ප්‍රවාහනය කරමින් සිටි පුද්ගලයෙකු ට්‍රැක්ටර් රථය ද සමඟ අත්අඩංගුවට** ගෙන කොඩිකාමම් පොලිසිය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 47 ක් වූ තුඩත්තේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. කොඩිකාමම් පොලිසිය මගින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය,**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**